
# මට මතකයි.... මට මතකයි.... සීයා අපේ තුම්!



**අ**නේ අම්මා ඉන්න එකෙන් අපිට හරි පහසුයි..... ඉස්කෝලෙ ඇරුණම පොඩි දුවව අරගෙන ගෙදර ගෙනියලා, බත් කවලා, අපි ඔෆිස් ඇරිලා එනකල් තියාගෙන ඉන්නවා නේ.... දුවත් හරි කැමතියි එහේ ඉන්න...”

– **ඒ අම්මා කෙනෙකුගේ පැත්තෙන්**

“ මම හැමදාම අපේ දුවගෙ දුවව ඉස්කෝලෙන් අරගෙන ගෙදර ගෙනියලා, කවලා, පොවලා, දුවයි මහත්තෙයයි හවසට එනකල් බලාගන්නවා.... ඒත් ඉතින් හැමදාමත් ඒක කරන්න අමාරුයි නේ....අපිත් දැන් දුර්වලයි...නේ.”

– **ඒ ආත්තම්මගෙ පැත්තෙන්**

“ අපේ ආත්තම්මා හරි හොඳයි.. අපිට හරි ආදරෙයි... චුට්ටක්වත් සැර නෑ... එදා ටීපෝ එක උඩ තිබුණු වීදුරු මල් පෝච්චිය මගේ අත වැදිලා බිම වැටිලා බිඳුණා.... බයට මට ඇඬෙන්න ආවා... ගෙදරදි වුනා නම් සැර කරනවා.... ටොක්කක් අනින්නත් තිබුණා... ඒත් ආත්තම්මා හිනාවෙලා මගේ ඔලුව අතගාලා කිව්වා.. කමක් නෑ පුතේ... ඕවා කොහොමත් කැඩෙන බිඳෙන දේවල් නේ... කියලා...” – **ඒ මිනිබිරියකගේ පැත්තෙන්** –

“ අනේ මම මේ බලන්නෙ කොහොම හරි අපේ අම්මව ගෙන්න ගන්න “මපපැර ඍදකසෲහි වලට.. මේ සැරේ අපට ලංකාවට යන්න හම්බවෙන්නෙත් නෑ.. මේ ගේ ප්‍රශ්නෙ හන්දා... අම්මා ආවොත් ළමයින්ටත් හොඳයි... අපිටත් බය නැතුව වැඩට යන්න පුළුවන්... අම්මා ආවම මේ සැරේ අම්මවත් එක් කරගෙන වේල්ස්, ස්කොට්ලන්ඩ් පැත්තේ යන්න ඕන.”

– **ඒ මෙහේ ලන්ඩන්වල ඉන්න දුවක්**

ඒත් අම්මලා මෙහේ ආවම කී දවසද ඉන්නේ? මාසයක් යනකොට ලංකාව මතක් වෙලා.

“ මල්පැල ටික මැරිලා ඇති වතුර නැතුව... වත්ත පහල දැන් බලන්න බැරුව ඇති කැලේ වැවිලා... එහේදි කී දෙනෙක් මුණ ගැහෙනවද දවසකට... අහල පහළ ඉන්නෙ නෑදෑයො දන්න අඳුරන මිනිස්සු... ගෙයින් එළියට බැස්සම ගෙවල් කීයකට ගොඩවෙන්න පුළුවන්ද... ආරාධනා නැතුව.. මෙච්චර කල් හිටියොත් අර පන්සලට දෙන මුර දානෙත් වෙන කෙනෙකුගෙ අතට යාවි... පුතේ මල්ලිගෙ පොඩි ඇයො ටික කොහොමද දන්නෙ නෑ... අනේ උන් මං ගැන අහනවා ඇති.. අපි මේ කන බොන දේවල් අනේ ඉතිං උන්ට එහේ නැහැ නේ...අනිත් කාරණේ මේ හීතලේ මෙහේ ඉන්න ඇහැකෙයි දරුවො.....? හෙට අනිද්දම මම ගෙදර යන්න ඕන...”

ඔන්න ඔහොම කියලා අම්මලා ආපහු ලංකාවට යන්න ලෑස්ති වෙනවා....

අම්මලා තාත්තලා විශ්‍රාම ගියාට පස්සෙ සෑහෙන කාර්‍ය්‍ය භාරයකට මුහුණ දෙනවා දරුවන්ගෙ දරුවො බලාගන්න, ඒ දරුවන්ගෙ දෙමාපියන් රැකියාවට හෝ වෙනත් ගමනක් ගොස් එනතුරු. එය භාරදූර කටයුත්තක්. නොසෑහෙන ගණනක් අය කරලා ළමයි බලාගන්න මේ රටවල ඉන්න Child-minders



වගේ නෙවෙයි, ආච්චිලා සීයලා ඒ කාර්‍ය්‍යය කරන්නේ ඉතා සතුටෙන්. පොඩි එවුනුත් හරි ආසයි ඒ ගොල්ල එක්ක ඉන්න.

රැකියාව කරන කාලෙදි ඉවසීම, උපේක්ෂාව ආදී දේ අම්මලා තාත්තලාගෙන් අතහැරෙන විට දරුවන් ආච්චිලා සීයලා වෙත හැරෙන්නේ ඇයි? මුළු දවසම වුනත් මුනුපුරු මිනිපිරියන්ගේ සුරතල් කතා, හපන්කම්, දඟකාරකම්, පුරසාරම්, ඉවසීමේ ශක්තිය ආච්චිලා, සීයලා කෙරෙහි ළඟාව ඇති නිසා. පොඩි එවුන් යම් දිනක වියපත් වූ විට ද ඒ ඉවසීම ඔවුන්ට ද ළඟා වේයයි සිතමි.

යමෙකු වයසට ගිය විට ජීවත් විය යුත්තේ තම දරුවන්ගේ දරුවන් උදෙසා, ඒ දරුවන් වැඩ රාජකාරිවලට ගොස් එනතුරු ඔවුන්ගේ දරුවන් බලා ගැනීමට නොව, තමන් ජීවිතයේ එතෙක් ලැබූ අත්දැකීම්වල සාරය සකසා, බාල පරපුරට පෙවීම සඳහාය. සීයලා, ආච්චිලාගෙන් හැරෙන්නට, ඒ කාර්‍ය්‍යය වෙනත් කිසිම කෙනෙකුගෙන් ඉෂ්ටවන්නේ නැත.

මා කුඩා කල ඉතා ආසා-වෙන් ගැයූ ළමා ගීයක දෙපදයක් මට දැනුදු මතකය.

මට මතකයි... මට මතකයි...
සීයා අපේ තුම්....
මිදුල පුරා... කෝටුවකින්...
ගෝනෙක් ඇඳ දුන්...

දරුවන් සමග මිදුලේ සෙල්ලම් කළේ සීයා ය. අම්මාට, තාත්තාට ඒකට වෙලාවක් තිබුණේ නැත. උතුම් සීයා අමතක නොවන විචිත්‍ර යමක් ඇඳ දුන්නේ මිදුල පුරා පමණක් නොවේ. දරුවාගේ මුළු ජීවිතයම පුරා ය.

♦ **අනුර හෑගොඩ**
**London**

# පද්‍යා රසයෙන් කවි පෙළක්

## වැල කෑ පබිලා

තොසින් වසන හේනේ දැන් කාලේ
ඉ ස න් අප්පුගේ පුත් මම පබිලේ
ග සි න් වැටුණු කුණු වැලකට ආලේ
අ ස න් න! මහතුනි මට වුණු අවුලේ

ලාබෙට ලැබුණාට පුහු පොල් කෑවා
ඒ පි ට වැල කුණුකුත් ඇද බෑවා
මේ වට බඩ පුම්බාගෙන ආවා
කෑ ම ට නරකයි කොයිවත් මේවා

රෝගේ තදවී හැදුනයි වමනේ
වා ගේ බෙර ගෙඩියක් බඩ පිපුණේ
මා ගේ ලොකු අයියගෙ කර පිටිනේ
මෝගේ ගෙදරට කෙරුවයි ගමනේ

තා ත් ත ඇයි බොල ආවේ ඇහුවා
බේත් බොන්න මම ආවයි කිවුවා
සා ත් තුවට අම්මත් නැත කීවා
මා ත් ඔහේ වැටිලා බුදි යෑවා

තුන් වේලක් ලුණු කැඳටම වේලුණි
ඉ න් පණ ටික මගෙ යන්තම් බේරුණි
ඔ න් න! ඉතින් මට වුණු එක අහමිනි
කන් න එපා! වැල පින් ඇති මහතුනි!

**රචනය - ශ්‍රීමත් ඩී. බී. ජයතිලක**

**ම**ගේ සුන්දර ළමා කාලයේ මම විවිධ පළාත් වල පාසැල් හතරක ඉගෙනුම ලැබුවෙමි. ඒ අතරින් එක් පාසැලක් වූයේ ගාල්ලේ පිලානේ බෞද්ධ මිශ්‍ර පාඨශාලාවයි. එය මා සාහිත්‍යයට යොමුකළ පාසැල් මාතාවයි. එකල හතරවන ප්‍රමාණයේ සිසුන්ට නියම කරනලද පොත් අතර **පද්‍යා රසය** නම් කවි එකතුවකින් සමන්විත රසවත් පද්‍ය සංග්‍රහයක් වීය. මෙහි පළ වන **වැල කෑ පබිලා** එහි වූ එක් පැදි පෙළකි.

වැල වරකා ගැන විශේෂ දැනුමක් ඇත්තේ ගමේ ළමයින්ට ය. වැල, කොස් ගහේ රස පළතුරක් වන නමුත් කුඩා ළමයින්ට එය කෑමට නොදෙන්නේ ඔවුන්ට ඒවා අපත්‍යයයි වැඩිහිටියන් සිතන බැවිනි. මේ වැල කෑ ළමයෙකුට සිදු වූ දේ ය. හාස්‍යයෙන් යුත් මේ කවි පෙළ රචනා කරන ලද්දේ ශ්‍රීලංකාවේ ප්‍රකට විද්වතෙකු හා අතීත නිදහස් සටනේ පුරෝගාමියෙකුද වන දේශප්‍රේමී අභාවප්‍රාප්ත ශ්‍රීමත් දොන් බාරොන් ජයතිලක විද්වතුන් විසිනි. – **දයා**



**සර් ඩී. බී. ජයතිලක**



**චිත්‍රය - තලන්ගම**

**ස**ර් ඩී. බී. ජයතිලක හෙවත් දොන් බාරොන් ජයතිලක මහතා 1948 අප රටට නිදහස ලැබෙන්නට පෙර ඒ නිදහස් සටන සඳහා කැපවී කටයුතු කළ දේශප්‍රේමීන් අතර මුල් පෙළ හෙබවූ කෙනෙකි. නිදහස ලබන්නට පෙර වූ රාජ්‍ය මන්ත්‍රණ සබාවේ සභිකයෙකු වූ ඒ මහතා ඉංග්‍රීසි, සිංහළ, පාලි, සංසකෘත ආදී භාෂාවන්හි හසල දැනුමක් ලැබ සිටියේ ය.

1936 දී පමණ ශ්‍රීලංකාවට විශ්ව විද්‍යාලයක් අවශ්‍යයයි සුදු පාලකයින්ගෙන් නොනවත්වා ඉල්ලා සිටි දේශප්‍රේමීන් අතර බාරොන් ජයතිලක, පොන්නම්බලම් රාමනාදන්, අරුණාචලම් ආදී අය වූහ. ඒ ඉල්ලීමේ ප්‍රතිඵලයක් ලෙස සුදු පාලකයෝ අප රටේ විශ්වවිද්‍යාලයක් පිහිටවූහ. පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ශාලාවන් ඔවුන්ගේ නම් වලින් හඳුන්වන්නට වූයේ ඒ දේශප්‍රේමීන්ට කරන ගෞරවයක් වශයෙනි.

ජයතිලක මහතා දක්ෂ කවියෙකුද වන බව ඒ මහතා ලියා ඇති පද්‍යයන්ගෙන් මොනවට පැහැදිලි වෙයි. එසේම කාව්‍යකරණයේදී හාස්‍ය උත්පාදනයට ඔවුන්ට විශේෂ හැකියාවක් වූ බව ද කිව යුතුය. ඩී. බී. ජයතිලක ශ්‍රීමතාණෝ 1944 දී රෝගාතුරව අභාවප්‍රාප්ත වූහ.

